රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2024-09-09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය පහසුකම ලබා ගැනීම**

ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උප වැඩසටහන් 02ක් යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක ප්‍රතිපත්ති පදනම් කර ගත් ණය මුදලක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීම සඳහා 2023-09-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 2023 දෙසැම්බර් වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක ණය මුදල පළමු උප වැඩසටහන සඳහා ලබා දී තිබේ. එහි දෙවන උප වැඩසටහන යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක ණය මුදල ලබා ගැනීම සඳහා පූර්ව ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් 12ක් සම්පූර්ණ කළ යුතු අතර, මේ වන විට එකී ක්‍රියාකාරකම් බොහොමයක් සම්පූර්ණ කර හෝ සම්පූර්ණ කිරීමේ අවසන් අදියරේ පවතී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහනේ දෙවන උප වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක ණය මුදල ලබා ගැනීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් අරමුදල් සලසා ගැනීම**

2015 වර්ෂයේ සිට ආසියානු සංවර්ධන බැංකුවේ බහු අදියර මූල්‍යකරණ පහසුකම යටතේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර, එම වැඩසටහන යටතේ ප්‍රධාන ව්‍යාපෘති 03ක් ක්‍රියාත්මක කරනු ලබයි. එම වැඩසටහනේ මුල් ඇස්තමේන්තුගත පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 675ක් වන අතර, ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 453ක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී ඇත. එහි පළමු වාරිකය 2015 වර්ෂයේදීත්, දෙවන වාරිකය 2017 වර්ෂයේදීත් ලබා දී තිබේ. ඉතිරි ණය මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 93ක් ලබා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ

සාකච්ඡා අවසන් කර ඇති අතර, අදාළ ණය ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලබා දී ඇත. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය පොදු ප්‍රාග්ධන සම්පත්වලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 93ක් ලබා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. ජල සම්පාදන සහ සනීපාරක්ෂක ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය මුදලක් ලබා ගැනීම**

ජල සම්පාදන සහ සනීපාරක්ෂක ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් වන ණය පහසුකම් 02ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් කටයුතු කරනු ලබයි. එම වැඩසටහන යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 100 බැගින් වන උප වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. එහි පළමු වැඩසටහන වන "ජලසම්පාදන මෙහෙයුම්වල දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව, සියලු පාර්ශ්වයන් ඇතුළත් වීම සහ පරිසර තිරසාරත්වය ශක්තිමත් කිරීම" සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ණය මුදල ලබා ගැනීම පිණිස වන සාකච්ඡා අවසන් කර ඇත. ඒ අනුව, එකී ණය මුදල ලබා ගැනීමට අදාළව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. ශ්‍රී ලංකාවෙන් චීන වෙළෙඳපොළට තිරිඟු නිවුඩු පෙති (Wheat Bran Pellets) අපනයනය කිරීම සම්බන්ධ ක්‍රියාපටිපාටිය (Protocol) සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

තිරිඟු පිටි සැකසීමේදී මෙරටට ආනයනය කරනු ලබන තිරිඟු බීජවලින් 20%ක පමණ ප්‍රමාණයක් නිවුඩඩ ලෙස ඉවත් කරනු ලබයි. මෙසේ ඉවත් කරනු ලබන නිවුඩඩ, තිරිඟු නිවුඩු පෙති ලෙස චීනයට අපනයනය කිරීම මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට හැකියාවක් පවතී. ඒ සඳහා නිශ්චිත ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමට දෙපාර්ශ්වය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. කෙටුම්පත් කරනු ලැබ ඇති අවබෝධතා ගිවිසුම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලබා දී ඇත. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුම කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ

මහජන චීන සමූහාණ්ඩු රජයේ සමාන්‍ය පරිපාලනය අතර අත්සන් තැබීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. සංස්කෘතික ප්‍රකාශනයන්හි විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යුනෙස්කෝ (2005) සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම**

යුනෙස්කෝ ආයතනය විසින් එහි සාමාජික රාජ්‍යයන්හි නිර්මාණය කරනු ලබන සංස්කෘතික ප්‍රකාශනයන්ගේ විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගත් සම්මුතියක් 2005 වර්ෂයේ සම්මත කර ගනු ලැබ ඇත. මේ වන විට සාමාජික රාජ්‍යයන් 156ක් එකී සම්මුතිය පිළිගෙන ඇති අතර, ශ්‍රී ලංකාව මෙතෙක් එම සම්මුතිය අපරානුමත කර නොමැත. යුනෙස්කෝ සම්මුතිය අපරානුමත කිරීම සලකා බැලීම පිණිස විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර, එකී කමිටුවේ නිර්දේශ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව සහ නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, සංස්කෘතික ප්‍රකාශනයන්හි විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යුනෙස්කෝ (2005) සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. බලශක්ති අංශය සඳහා නව නියාමන ආයතනයක් හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ ඛනිජතෙල්, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු, ද්‍රවීකෘත ස්වභාවික වායු සහ ලිහිසි තෙල් යන අංශයන් සඳහා නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස කමිටුවක් පත් කිරීම සඳහා 2024-04-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව පත් කරනු ලැබ ඇති කමිටුව විසින් බලශක්ති අංශය සඳහා නව නියාමන ආයතනක් හඳුන්වා දීම පිණිස සිය නිර්දේශ ඉදිරිපත් කර තිබේ. එකී කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, ඛනිජතෙල් කර්මාන්තය නියාමනය සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව මඟින් කළමනාකරණය කරන ධීවර වරාය ද්‍රෝණිවල පවතින වැලි නිධි ගොඩ දැමීම සඳහා වූ යෝජනාව**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව යටතේ වන වරායන් 22හි වැලි නිධි ඉවත් කිරීමේ කාර්යය සඳහා අභිලාෂයන් ප්‍රකාශ කිරීම් කැඳවීම පිණිස 2024-02-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින්, එම සංස්ථාව මඟින් කළමනාකරණය කරනු ලබන ධීවර වරාය ද්‍රෝණිවල කැණීම් සේවාවන් මුදල් අය කර ගැනීමෙන් තොරව සිදු කර ගැනීමට සහ කිරින්ද, හලාවත හා වාලච්චේන ධීවර වරායවල කැණීම් කරන ලද අමුද්‍රව්‍ය වාණිජමය වශයෙන් උපයෝගි කර ගැනීම සඳහා වන ව්‍යාපෘති යෝජනාවන් සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීම කැඳවීම් සිදු කරනු ලැබ තිබේ. ඒ සඳහා සමාගම් 03ක් විසින් යෝජනා ඉදිරිපත් කර ඇති අතර, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව කිරින්ද, හලාවත හා වාලච්චේන ධීවර වරායන්හි මුදල් අය කර ගැනීමෙන් තොරව කැණීම් සිදු කිරීමේ කොන්ත්‍රාත්තුව සීමාසහිත සුප්‍රීම් ග්ලෝබල් හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගම වෙත ප්‍රදානය කිරීම පිණිස ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. ජංගම උපකරණවල ජාත්‍යන්තර හිමිකම් පිළිබඳ (කේප් ටවුන් සම්මුතිය) පනත් කෙටුම්පත**

ජංගම උපකරණවල ජාත්‍යන්තර හිමිකම් පිළිබඳ (කේප් ටවුන් සම්මුතිය) සහ ගුවන්යානා උපකරණවලට විශේෂිත වූ කරුණු හා සම්බන්ධිත ජංගම උපකරණවල ජාත්‍යන්තර අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන හඳුන්වා දීම පිණිස 2023-01-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **මූල්‍ය ස්ථායිතා අරමුදලක් පිහිටුවීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනයන්හි අර්බුද කළමනාකරණ රාමුව යටතේ බැංකු නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම හදිසි ප්‍රමුඛතාවක් ලෙස කළ යුතු කටයුත්තක් බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුනාගෙන ඇත. 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 15 වන වගන්තිය යටතේ, නිරාකරණය කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පනතේ විධිවිධාන සලස්වා ඇති නිරාකරණ ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මූල්‍ය ස්ථායිතා අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 15(2) වගන්තියට අනුව මූල්‍ය ස්ථායිතා අරමුදල ස්වාධීන අරමුදලක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙනත් වත්කම්වලින් සහ මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන වත්කම්වලින් වෙන්ව කළමනාකරණය කරනු ලැබිය යුතුය. 2024-07-31 දින වන විට, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් සපයනු ලබන මූලික මූල්‍ය වෙන් කිරීම් භාවිතා කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ස්ථායිතා අරමුදල පිහිටුවීම සහ ඵලදායී නිරාකරණ රාමුවක් සහතික කිරීම සඳහා විස්තීරණ මාර්ගෝපදේශ සමඟ මූල්‍ය ස්ථායිතා අරමුදල ක්‍රියාත්මක කිරීම, මූල්‍ය අංශයේ ස්ථායිතා සහ ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි 2 වන උප වැඩසටහනෙහි දර්ශක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක් ලෙස ඇතුළත් කර ඇත. ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මූල්‍ය අංශයේ ස්ථායිතා සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක ණය මුදලක් මෙම වසර තුළ ලබා ගැනීමට අපේක්ෂිතය. ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් සපයනු ලබන රුපියල් මිලියන 1,000ක නාමික මුදලකින් මූල්‍ය ස්ථායිතා අරමුදල ස්ථාපිත කිරීමටත්, පවතින මූල්‍ය අවකාශයේ සීමාවන්ට යටත්ව වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන ලබා දෙමින් ක්‍රමානුකූලව අරමුදල ගොඩනැඟීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **භාණ්ඩ ආනයනය කිරීමේදී අය කරනු ලබන ආනයන බදු සංශෝධනය කිරීම**

මෙරටට භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේදී අය කරනු ලබන බදු වර්ග එනම්, රේගු ආනයන බද්ද (තීරු බද්ද), සෙස් බද්ද, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සහ වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාත්මක කළ යුතු වන සහ කාලීනව ඉදිරිපත් වී ඇති දේශීය කර්මාන්ත හා වෙළෙඳ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම් මත, පහත සඳහන් පරිදි කටයුතු කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත:

* විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත්ව පවතින ඇතැම් ආනයන භාණ්ඩ එම බද්දෙන් නිදහස් කර රේගු ආනයන බද්ද ඇතුළු සාමාන්‍ය ආනයන බදු ව්‍යුහයට ඇතුළත් කිරීම.
* දුඹුරු සීනි ආනයනය සඳහා ආනයන රේගු බද්ද සංශෝධනය කිරීම.
* දේශීය කර්මාන්ත බලගැන්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ මත රේගු සංකේතාංක 225ක් යටතට අයත් පාවහන්, ඇසුරුම්, විදුලි යන්ත්‍රෝපකරණ, ප්ලාස්ටික් සහ රබර් කර්මාන්තයට අයත් අමුද්‍රව්‍ය සහ අකරමැදි භාණ්ඩ සම්බන්ධයෙන් ආනයන බදු සංශෝධනය කිරීම.
* ළමා සහ වැඩිහිටි අපද්‍රව්‍ය අවශෝෂක (Diapers) සහ ඒ සඳහා වන අමුද්‍රව්‍ය මත වූ බදු අඩු කිරීම.
* ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය සඳහා අදාළ වන පරිදි බදු සංශෝධනයන් හඳුන්වා දීම.
* දේශීයව සාපැදි සහ උපාංග නිෂ්පාදන කර්මාන්තය, මුද්‍රණ හා මුද්‍රණ තීන්ත කර්මාන්තය, දේශීයව රෙදි සෝදන යන්ත්‍ර, ලයිටර් නිෂ්පාදන කර්මාන්ත සහ ළමා නිමි ඇඳුම් ආනයනය සම්බන්ධයෙන් පවතින ආනයන බදු විෂමතාවන් ඉවත් කිරීම.

* තල් හා තල් නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය, විදුලියෙන් ක්‍රියා කරන සෙල්ලම් භාණ්ඩ හා දේශීය ඖෂධ නිෂ්පාදනයට යොදා ගන්නා තිප්පිලි වෙන්ව හඳුනාගැනීමට නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක හඳුන්වා දීම සහ දේශීය ඖෂධ නිෂ්පාදනයට යොදා ගන්නා අමුද්‍රව්‍ය ආනයනයේදී සෙස් බදු නිදහස් කිරීම සඳහා පවත්නා ක්‍රමවේදය සරල කිරීම.

ඉහත සඳහන් පරිදි ආනයන බදු සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම පිණිස පහත සඳහන් පියවර ගැනීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ ආඥාවක් නිකුත් කර එමඟින් රේගු ආනයන බදු සංශෝධනය කිරීම.

* 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු සංශෝධනය කිරීම.

* 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් පැනවීම.

* අදාළ බදු සංශෝධනයන්ට සමගාමීව 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනත සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ අවශ්‍ය වන්නා වූ ක්‍රියාමාර්ග ගැනීම.

**11. 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද 2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම (කොළඹ වරාය නගරය සඳහා විවෘත ගිණුම් ක්‍රමය යොදා ගැනීම)**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ පනවන ලද 2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි 2024-08-21 දිනැති අංක 2398/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. ඒ අනුව, එකී රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. විශ්වවිද්‍යාල සිසුන්ගේ මහපොළ හා ශිෂ්‍යාධාර ඉහළ නැංවීම**

විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලබා දෙන මහපොළ හා ශිෂ්‍යාධාර වාරික 2015 වර්ෂයේ සිට මේ දක්වා වැඩි කර නොමැති බැවින්, එකී වාරික මුදල් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව අධ්‍යාපන අමාත්‍යතුමා සහ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාවක් මඟින් අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු කර තිබුණි. එම යෝජනාව සැලකිල්ලට ගෙන, මහපොළ ශිෂ්‍යත්ව වාරිකය රුපියල් 7,500/- දක්වාත්, ශිෂ්‍යාධාර වාරිකය රුපියල් 6,500/- දක්වාත් 2025 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

**13. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා වන තොරතුරු තාක්ෂණ උපායමාර්ගික සැලැස්ම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම වැඩසටහන යටතේ ව්‍යුහාත්මක මිනුම් දණ්ඩක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඩිජිටල්කරණය කිරීමට උපකාර වන තොරතුරු තාක්ෂණ උපායමාර්ගික සැලැස්මක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සකස් කර 2024 අගෝස්තු මාසය අවසන් වන විට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබීම අවශ්‍ය වේ. ඒ අනුව, 2025-2027 කාලසීමාව සඳහා සකස් කරන ලද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා වන තොරතුරු තාක්ෂණ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. දුම්රිය ස්ථාන ආශ්‍රිත ගොඩනැගිලි වාණිජ මධ්‍යස්ථාන වශයෙන් සංවර්ධනය කිරීම**

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමය යටතේ කොළඹ නගරය ආශ්‍රිතව පිහිටි කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, කොම්පඤ්ඤවීදිය, දෙහිවල සහ ගල්කිස්ස යන දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා කැමැත්ත දක්වන ආයෝජකයින් හඳුනා ගැනීම පිණිස අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවා ඇත. එහිදී ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානයන්හි පිහිටා ඇති දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම් ඉදිරිපත් වී ඇති බැවින්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ දිවයින පුරා පිහිටි දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීමේ හැකියාව පවතින බව පෙනී ගොස් තිබේ. ඒ අනුව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ දිවයිනේ අනෙකුත් දුම්රිය ස්ථාන ද සංවර්ධනය කිරීම සඳහා තරගකාරී පදනමින් යෝජනා කැඳවා සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**15. රථ වාහන මාර්ග නීති උල්ලංඝණය වූ අවස්ථාවලදී අධිකරණයට ඉදිරිපත් නොකරන වැරදි සඳහා අය කෙරෙන දඩ මුදල් එකතු කිරීමේ ක්‍රමවේදය සහ රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික විසඳුමක් හඳුන්වා දීම**

රථ වාහන මාර්ග නීති උල්ලංඝණය වූ අවස්ථාවලදී අධිකරණයට ඉදිරිපත් නොකරන වැරදි සඳහා අය කෙරෙන දඩ මුදල් එකතු කිරීමේ ක්‍රමවේදය සහ රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික විසඳුමක් හඳුන්වා දීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම පිණිස ද්වීත්ව කවර ක්‍රමය යටතේ යෝජනා කැඳවා ඇත. ඒ සඳහා ලංසුකරුවන් 09 දෙනෙකු විසින් යෝජනා ඉදිරිපත් කර තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශය මත පදනම්ව අදාළ ප්‍රසම්පාදනය Millenium I.T.E.S.P (Pvt) Ltd. and Metropolitan Technologies (Pvt) Ltd. Joint Venture වෙත ප්‍රදානය කිරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **ශ්‍රී ලංකාව BRICS සංවිධානයට ප්‍රවේශ වීමේ හැකියාව**

ශ්‍රී ලංකාව BRICS සංවිධානයට ප්‍රවේශ වීමට අදාළ කරුණු විමර්ශනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා නිලධාරි කමිටුවක් පත් කිරීමට 2024-01-24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව පත් කරන ලද නිලධාරි කමිටුව විසින් ශ්‍රී ලංකාව BRICS සංවිධානයට මෙන්ම ඒ යටතේ ස්ථාපිත කිරීමට නියමිත නව සංවර්ධන බැංකුවට ප්‍රවේශ වීමේ වාසි සහ අවාසි පරීක්ෂා කර කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශ්වයන් විසින් BRICS සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම සම්බන්ධයෙන් ධනාත්මකව ප්‍රතිචාර දක්වා තිබේ. ඒ අනුව, අදාළ රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් ශ්‍රී ලංකාව BRICS සංවිධානයේ සහ ඒ යටතේ පිහිටුවීමට නියමිත නව සංවර්ධන බැංකුවේ සාමාජිකත්වය සඳහා අයදුම් කිරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ප්‍රතිලාභ පුළුල් කිරීම**

2025 ජනවාරි මස සිට වඩාත් ආකර්ෂණීය ප්‍රතිලාභ සහිතව රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම විශ්‍රාමිකයින් සඳහා වඩාත් පහසුකම් සලසන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම පිණිස 2024-08-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සියලුම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුපෙන් සහ රාජ්‍ය අංශයේ සියලුම සේවකයින්ගේ වැටුපෙන් මාසිකව රුපියල් 1,000/-ක දායක මුදලක් අය කර ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කිරීමටත්, එමඟින් යෝජිත වැඩි පහසුකම් සහිත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය 2025 වසරේ සිට ක්‍රියාත්මක කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************